17598

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**14 S I, II**

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
## கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
## General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

**කතෝලික ධර්මය I, II**
கத்தோலிக்கத் திருமறை I, II
Catholicism I, II

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

## කතෝලික ධර්මය I

*උපදෙස්:*

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

※ අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.

※ **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**

※ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** ශුද්ධ බයිබලයේ අඩංගු දිවැසිවර ග්‍රන්ථයක් වන්නේ
(1) ඔබදියා ය. (2) ජෝෂුවා ය. (3) ජෝබ් ය. (4) දානියෙල් ය.

**2.** අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත රචනා කරනු ලැබුවේ ග්‍රීසියේ පිහිටි කවර නගරයේ ද?
(1) ඇතන්ස් (2) අක්කාය
(3) ට්‍රිපොලිස් (4) කොරින්තිය

**3.** ශුද්ධ වූ පාවුලුතුමාගේ ලිපි (හසුන්පත්) සංඛ්‍යාව වන්නේ
(1) 13 කි. (2) 14 කි. (3) 16 කි. (4) 21 කි.

**4.** සිරියානු අධිරාජ්‍යයේ IV වන ඇන්ටිඕකස් යටතේ ජුදා ජාතිකයින් දරුණු පීඩනයකට ලක්ව සිටි සමයක ලියවුණු ග්‍රන්ථය වන්නේ
(1) ජෙරමියා ය. (2) යෙසායා ය.
(3) නෙහෙමියා ය. (4) දානියෙල් ය.

**5.** ජීවිත හරය, එහි ගැටලු සහ විනිශ්චය පිළිබඳ සංකල්පනා ආශ්‍රිතව කෙරෙන විග්‍රහයක් වන්නේ
(1) රාජ්‍ය සභා ප්‍රඥාව ය. (2) අභිධාර්මික ප්‍රඥාව ය.
(3) පවුල සහ ගෝත්‍රික ප්‍රඥාව ය. (4) එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥාව ය.

**6.** ශුද්ධ වූ පේදුරුතුමාගේ ප්‍රකාශය පිළිබඳ ව ජේසුස් වහන්සේ දුන් ප්‍රතිචාරය සැබෑ වූයේ එතුමන් ජුදයින් අතට පාවා දෙනු ලැබීමෙන් පසුව
(1) පිළාත් රජ ඉදිරියේ දී ය. (2) හෙරෝද් රජ ඉදිරියේ දී ය.
(3) ගෙත්සමනි උද්‍යානයේ දී ය. (4) උත්තම පූජකයාගේ මැඳුරේ දී ය.

**7.** ශුද්ධ වූ සභාවේ පළමු ප්‍රාණ පරිත්‍යාගීවරයා වන්නේ
(1) ශුද්ධ වූ මාක්තුමා ය. (2) ශුද්ධ වූ පේදුරුතුමා ය.
(3) ශුද්ධ වූ ස්තේපන්තුමා ය. (4) ශුද්ධ වූ මහා ජාකොබ්තුමා ය.

**8.** ජුදා දහම, නීතිය හා ව්‍යවස්ථාව පිළිබඳ ගැඹුරු ඥානයක් තිබුණු පුද්ගලයෙක් වන්නේ
(1) ශුද්ධ වූ ලූක්තුමා ය. (2) ශුද්ධ වූ පාවුලුතුමා ය.
(3) ශුද්ධ වූ මතෙව්තුමා ය. (4) ශුද්ධ වූ බර්ණබස්තුමා ය.

[දෙවැනි පිටුව බලන්න.

**9.** 1936 වසරේ ආර්ජන්ටිනාවේදී ජෝර්ජ් මාරියෝ බර්ගොලියෝ නමින් ඉපිද, පසුව කතෝලික සභාවේ ශුද්ධෝත්තම පියතුමෙක් බවට පත්වූයේ
(1) අති උතුම් I වන ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා ය.
(2) අති උතුම් II වන ජුවාම් පාවුලු ශුද්ධෝත්තම පියතුමා ය.
(3) අති උතුම් XIV වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා ය.
(4) අති උතුම් XVI වන බෙනඩික් ශුද්ධෝත්තම පියතුමා ය.

**10.** පහත සඳහන් ප්‍රකාශ කෙරෙහි අවධානය යොමු කරන්න.
A – ක්‍රිස්තුන් වහන්සේ විසින් ස්ථාපිත කර තිබීම
B – දෙවියන් වහන්සේ විසින් තෝරාගත් ජනතාවගෙන් සෑදී තිබීම
C – ශුද්ධාත්මයාණන් විසින් මෙහෙයවනු ලැබීම
D – ක්‍රිස්තුන් වහන්සේ ඇය තුළ විද්‍යාමාන වීම
E – ක්‍රිස්තුන් වහන්සේ විසින් ඇයව සමස්ත මිනිස් වර්ගයා වෙත යවා තිබීම
ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ශුද්ධ වූ සභාවේ කතෝලිකත්වය සඳහන් වන ප්‍රකාශ යුගලය තෝරන්න.
(1) A හා B (2) B හා C (3) C හා D (4) D හා E

**11.** ශුද්ධ වූ ජුසේ වාස් පියතුමා අයත් නිකාය වූයේ
(1) කාර්මෙල් ය. (2) දොමිනිකාන ය.
(3) ඔරතෝරියානු ය. (4) ෆ්‍රැන්සිස්කාන ය.

**12.** "ඔබ සභාවක් වශයෙන් එක්රැස්වන විට සමිඳාණන් වහන්සේගේ රාත්‍රී භෝජනය වැළඳීමක් සිදු නොවේ. මන්ද ..." යැයි සඳහන් වන්නේ ශුද්ධ වූ බයිබලයේ,
(1) රෝම ලිපියෙහි ය. (2) එපීස ලිපියෙහි ය.
(3) කොරින්ති ලිපියෙහි ය. (4) තෙසලෝනික ලිපියෙහි ය.

**13.** සුබාරංචි කතුවරුන් සතර දෙනාම වාර්තා කරන එකම ප්‍රාතිහාර්යය වන්නේ
(1) මුහුද මත ඇවිදීමේ ප්‍රාතිහාර්යයයි. (2) පූප වැඩි කිරීමේ ප්‍රාතිහාර්යයයි.
(3) ජායිරස්ගේ දියණිය සුව කළ ප්‍රාතිහාර්යයයි. (4) ලාදුරු රෝගීන් දසදෙනා සුව කළ ප්‍රාතිහාර්යයයි.

**14.** සමිඳාණන් වහන්සේගේ අන්තිම රාත්‍රී භෝජනය වෙනුවට ජුවාම්තුමා තම සුවිශේෂයේ සඳහන් කරන සිද්ධිය වන්නේ
(1) දේව මාළිගය පවිත්‍ර කිරීමයි. (2) ජලය මිදි රසට හැරවීමයි.
(3) පවුකාර ස්ත්‍රියට සමාව දීමයි. (4) ශ්‍රාවකයන්ගේ පාද සේදීමයි.

**15.** පුරාණ ගිවිසුමේ යාග පූජා සඳහා ආහාරපාන, සතුන් හා තෙල් යොදා ගැනුණ ද, එයින් වඩාත් ම වැදගත් වූයේ
(1) සත්ත්ව පූජා ය. (2) ධාන්‍ය පූජා ය.
(3) ආහාරපාන පූජා ය. (4) තෙල් පූජා ය.

**16.** පාපී ඇල්මෙන් ජීවත්වන මිනිසා ඉන් නිදහස් කිරීමට යොමු කරවන කරුණ වන්නේ
(1) බොරු කීමෙන් වැළකීමයි.
(2) සොරකම් කිරීමෙන් වැළකීමයි.
(3) නිරතුරු සාමය උදෙසා වැඩ කටයුතු කිරීමයි.
(4) එකම දෙවියන් වහන්සේට පමණක් නමස්කාර කිරීමයි.

**17.** තමන්ට පැවරී ඇති වගකීම් ඉටු නොකිරීම කුමන පනතට විරුද්ධව කරනු ලබන පාපයක් ද?
(1) පළමු පනතට (2) දෙවන පනතට
(3) තුන්වන පනතට (4) හතරවන පනතට

**18.** පහත සඳහන් ප්‍රකාශ කෙරෙහි අවධානය යොමු කරන්න.
A – අන් අයගේ අනාගතය විනාශ කිරීම
B – පොදු දේපළ විනාශ කිරීම
C – බොරු නඩුවලට පැටලවීම
D – ගුරුවරුන්ට අකීකරු වීම
ඉහත සඳහන් ප්‍රකාශ අතුරෙන් පස්වන පනතට විරුද්ධ ක්‍රියා යුගලය වන්නේ
(1) A හා B ය. (2) A හා C ය. (3) B හා C ය. (4) B හා D ය.

[තුන්වැනි පිටුව බලන්න.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

**19.** 'දෙවියන් වහන්සේගේ මධ්‍යස්ථකයාණෝ' යන විශ්ව ලේඛනය ඉදිරිපත් කළ ශුද්ධෝත්තම පියතුමා වන්නේ
(1) අති උතුම් XII වන පියුස් ශුද්ධෝත්තම පියතුමා ය.
(2) අති උතුම් XIII වන ජුවාම් ශුද්ධෝත්තම පියතුමා ය.
(3) අති උතුම් XIII වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා ය.
(4) අති උතුම් XI වන පියුස් ශුද්ධෝත්තම පියතුමා ය.

**20.** අනාගත සභාවේ එකමුතුකම වෙනුවෙන් ජේසුස් වහන්සේ යාච්ඤා කළේ
(1) ශුද්ධ වූ සභාව ලොව පුරා පැතිර යන නිසා ය.
(2) විශ්වාසය නිසා විවිධ ජාතීන් සටන් වදින නිසා ය.
(3) අනාගතයේ දී ශුද්ධ වූ සභාව කැඩී යන බව දැන සිටි නිසා ය.
(4) අනාගතයේ දී ශුද්ධ වූ සභාවට පීඩන ඇතිවන බව දැන සිටි නිසා ය.

**21.** හෙබ්‍රෙව් ශුද්ධ ලියවිල්ල ග්‍රීක භාෂාවට පරිවර්තනය කිරීමට පවරන ලද්දේ කුමන රජතුමා ද?
(1) නබුකද්නේසර් (2) දිමිත්‍රියස් නම් II වන ටොලමි
(3) මහා ඇලෙක්සැන්ඩර් (4) තේඕස් නම් II වන අන්තිඕකුස්

**22.** දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කළ, උන් වහන්සේගේ පණිවිඩය ජනතාවට ප්‍රකාශ කළ පිරිස හැඳින්වූයේ
(1) ආදී පිතෘවරුන් ලෙස ය. (2) ජන නායකයන් ලෙස ය.
(3) ඉශ්‍රායෙල් දිවැසිවරුන් ලෙස ය. (4) උපස්ථායකයින් ලෙස ය.

**23.** සියලු බලැති සමිඳාණන් වහන්සේ තම දෑසින් දුටු බව පැවසූ දිවැසිවරයා වන්නේ
(1) එසකියෙල් ය. (2) යෙසායා ය. (3) ජෙරමියා ය. (4) හොසියා ය.

**24.** දෙවියන් වහන්සේගේ පණිවිඩය සංකේතාත්මකව ලබාගත් දිවැසිවරයා වන්නේ
(1) යෙසායා ය. (2) ජොවෙල් ය. (3) එසකියෙල් ය. (4) ජෙරමියා ය.

**25.** සෙබදිගේ හා සලෝමිගේ පුත්‍රයන් දෙදෙනා කවුරුන් ද?
(1) ජොහන් සහ ජාකොබ් (2) ජාකොබ් සහ ඇන්ඩෘ
(3) පේදුරු සහ ජොහන් (4) ජාකොබ් සහ පේදුරු

**26.** මිනිසාට, තම ආදරය හා රැකවරණය විදහා පෑමට දෙවි සමිඳුන් උපයෝගී කර ගන්නා ලද්දේ
(1) සාසන නීතිය ය. (2) ශුද්ධ වූ සභාවේ පනත් ය.
(3) ස්වභාව ධර්මය ය. (4) භාග්‍ය අට ය.

**27.** දෙවියන් වහන්සේ නෝවා සමග සහ ආබ්‍රහම්තුමා සමග ඇති කර ගත් ගිවිසුම්වල බාහිර සංකේත වන්නේ පිළිවෙළින්
(1) දේදුන්න සහ චර්මඡේදනයයි. (2) ගංවතුර සහ දේදුන්නයි.
(3) දේදුන්න සහ නොදැවෙන පඳුරයි. (4) චර්මඡේදනය සහ ගිනිටැඹයි.

**28.** ස්නාවක ජුවාම්තුමාගේ උපත දේව දූතයෙකු විසින් දැනුම් දෙන ලද්දේ කා හට ද?
(1) මරියතුමියට (2) ජුසේතුමාට
(3) අගුස්තීනුතුමාට (4) සකරියස්තුමාට

**29.** ගලීලයේ ආණ්ඩුකාර හෙරෝද් රජතුමාගේ වැරදි ක්‍රියා හෙළා දක්වමින් ප්‍රසිද්ධියේ කථා කළේ
(1) ශුද්ධ වූ පේදුරුතුමා ය. (2) ස්නාවක ජොහන්තුමා ය.
(3) ජොහන් මාක්තුමා ය. (4) ශුද්ධ වූ පාවුලුතුමා ය.

**30.** දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ යැයි කියනු ලබන්නේ කුමන භාග්‍යවන්තයින්ට ද?
(1) නිහතමානී ගුණ ඇත්තන්ට (2) යුක්තිය උදෙසා පීඩා විඳින්නන්ට
(3) සාමය ඇති කරන්නන්ට (4) නිර්මල සිත් ඇත්තන්ට

**31.** 'රෝගීන්ගේ දිව්‍යමය ආලේපය' නැමැති අපෝස්තලික ව්‍යවස්ථාව ප්‍රකාශයට පත් කළේ කවුරුන් විසින් ද?
(1) අති උතුම් VI වන පාවුලු ශුද්ධෝත්තම පියතුමා
(2) අති උතුම් II වන පාවුලු ශුද්ධෝත්තම පියතුමා
(3) අති උතුම් XIV වන ලියෝ ශුද්ධෝත්තම පියතුමා
(4) අති උතුම් ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමා

**32.** රාජගුරු ප්‍රසාදිවරයකු යටතේ තේවාචාර්යවරුන් ඉටු කරන සේවාවන් හඳුන්වනු ලබන්නේ
(1) ගිහි අපෝස්තලික සේවාවන් ලෙස ය.
(2) එඬේරික පාලනය තුළ සිදුකරනු ලබන සේවාවන් ලෙස ය.
(3) පූජා සේවාවන් ලෙස ය.
(4) ප්‍රසාද ස්නාපනික සේවාවන් ලෙස ය.

**33.** "දරු සම්පත සමිඳාණන්ගෙන් ලැබෙන දායාදයකි. ඒ සම්පත එතුමන්ගෙන් ලැබෙන ඉමහත් ආශිර්වාදයකි." මෙසේ සඳහන් වන්නේ
(1) එපීස ලිපියෙහි ය. (2) ජාකොබ් ලිපියෙහි ය.
(3) ගීතාවලියෙහි ය. (4) හිතෝපදේශයෙහි ය.

**34.** ෆ්‍රැන්සිස්කාන ධර්මදූත සහෝදරතුමන්ලා ඉටුකරන සේවා **දෙකක්** වන්නේ
(1) මිසම තුළ දහම් සේවය හා අධ්‍යාපනික සේවාවයි.
(2) ධර්මෝපදේශය සහ ධර්මදානයයි.
(3) වතුවල සේවය සහ සෞඛ්‍ය සේවාවයි.
(4) ධර්මදානය හා ළමා නිවාස පවත්වාගෙන යාමයි.

**35.** ශුද්ධාත්මික ක්‍රිස්තු දේහයේ සාමාජිකත්වය ලබන්නේ
(1) ප්‍රසාද ස්නාපනය තුළින් ය. (2) දිව්‍ය සත්ප්‍රසාදය තුළින් ය.
(3) පූජකවරය තුළින් ය. (4) රෝගීන්ගේ ආලේපය තුළින් ය.

**36.** පහත සඳහන් පද පේළි සලකන්න.
A – වෛරයෙන් පිරුණු තැනට ප්‍රේමය
B – සාමය තුළ ජීවිතය ගොඩනැඟීමට
C – බලාපොරොත්තු සුන් වූ තැනට බලාපොරොත්තුව
D – තේරුම් ගනු ලැබීමට වඩා තේරුම් ගැනීමට
E – සාතන් පරාජය කර ක්‍රිස්තුන් වහන්සේව අයිතිකර ගැනීමට

ඉහත සඳහන් පද පේළි අතුරෙන් අසීසියේ ශුද්ධ වූ ෆ්‍රැන්සිස් මුනිතුමාගේ යාච්ඤාවේ අඩංගු පද පේළි පමණක් ඇතුළත් වරණය කුමක් ද?
(1) A, B හා C (2) A, C හා D (3) A, D හා E (4) B, C හා D

**37.** පාස්කුව, නත්තල හා දේවස්ථාන මංගල්‍යවලට සූදානමකින් යුතුව වරප්‍රසාදීය තත්ත්වයකින් සහභාගී වීමට නම්
(1) දිව්‍ය සත්ප්‍රසාදය ලබා ගත යුතු ය. (2) එක්වරු ශීලය රැකිය යුතු ය.
(3) පාපොච්චාරණය කළ යුතු ය. (4) දයාවේ ක්‍රියා කළ යුතු ය.

**38.** එක්වරු ශීලයේ පරමාර්ථයක් වන්නේ
(1) දස පනත අනුසාර කිරීම ය. (2) පුණ්‍ය ක්‍රියාවල නිරතවීම ය.
(3) ශික්ෂාපද අනුගමනය කිරීම ය. (4) ආත්ම දමනය පුහුණු කිරීම ය.

**39.** යාච්ඤාවෙන් ඉල්ලූ දෑ නොවැරදීම ලැබෙන බවට විශ්වාස කරමින් කරනු ලබන විශ්වාසයේ ප්‍රකාශය කුමක් ද?
(1) 'පැසසුම් වේවා!' (2) 'අලේලූයියා'
(3) 'ඔබ සමග වන සේක්වා' (4) 'ආමෙන්'

**40.** ප්‍රංශයේ ලූර්දු නුවර දී දේව මාතාවන් දර්ශනය වූයේ
(1) බර්ණදෙත්ට ය. (2) ජසින්තාට ය.
(3) ලුසීට ය. (4) ෆ්‍රැන්සිස්කෝට ය.

* *



PAST PAPERS WIKI
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**14 S I, II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2025(2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2025(2026)
General Certificate of Education (Ord. Level) Examination, 2025(2026)

| | |
|---|---|
| කතෝලික ධර්මය | I, II |
| கத்தோலிக்கத் திருமறை | I, II |
| Catholicism | I, II |

## කතෝලික ධර්මය II

* **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** (i) එළිදරව් සාහිත්‍යයේ ලක්ෂණයක් වන 'යුගාන්තවාදය' තුළදී සිදුවන ක්‍රියාවන් **දෙකක්** ලියන්න.

(ii) දේශීය කිතුනු සාහිත්‍යයක් ගොඩනැගීම සඳහා ගෞරවනීය ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා විසින් විශාල සේවාවක් ඉටු කරන ලද ක්ෂේත්‍ර **දෙකක්** ලියන්න.

(iii) ශුද්ධ වූ මැක්සිමිලියන් කොල්බේ මුනිතුමා දර්ශනය කළ දේව මාතාවන්ගේ දෑතෙහි තිබූ රතු සහ සුදු රෝස ඔටුණු තුළින් අර්ථවත් කරන්නේ කුමක් දැයි සඳහන් කරන්න.

(iv) මයර්‍යාදාවය ඇතිව ජීවත්වීමට කිතුනුවකු පිළිපැදිය යුතු කරුණු **දෙකක්** සඳහන් කරන්න.

(v) දිව්‍ය පූජාවකදී දක්නට ලැබෙන මුලසුනේ යැදුම් **දෙකක්** නම් කරන්න.

(vi) "මා ළාබාලයෙකු වන බැවින් මම කතා කරන්නට නොදනිමි." මෙම ප්‍රකාශය කා විසින් කා හට කියන ලද්දක් ද?

(vii) ස්නාවක ජුවාමිතුමාගේ උපත පිළිබඳ දැනුම් දුන් අවස්ථාවේ, එතුමා පිළිබඳ දේව දූතයා ප්‍රකාශ කළ වැදගත් කරුණු **දෙකක්** ලියන්න.

(viii) පශ්චාත්තාපී ක්‍රියා **දෙකක්** ලියා දක්වන්න.

(ix) නව යොවුන්වියේ සිටින දරුවන්ගේ ජීවිත ගොඩ නගා ශක්තිමත් කරන 'H'වලින් ආරම්භ වන මූලාග්‍ර **දෙකක්** ලියන්න.

(x) 'ලෙක්සියෝ ඩිවිනා' (Lectio Divina) භාවනා ක්‍රමයේ පියවර **දෙකක්** ලියන්න.

**2.** (i) තෙරේසා මව්තුමිය විසින් වීදි දරුවන් සඳහා ආරම්භ කරන ලද පාසලට පැමිණි ළමුන්ට අධ්‍යාපනය ලබාදීමට අමතරව ඉටුකළ වෙනත් සේවාවන් **දෙකක්** ලියන්න.

(ii) ගරු මයිකල් රුද්‍රිගෝ පියතුමාගේ සේවාවන් අතර ප්‍රධාන ස්ථානයක් ගත් ක්ෂේත්‍ර **තුනක්** නම් කරන්න.

(iii) ඔබ නිවස අසල වෙසෙන දිළිඳු පවුල්වල භෞතික අවශ්‍යතා සම්පූර්ණ කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **පහක්** කෙටියෙන් විස්තර කරන්න.

**3.** (i) යාච්ඤාවේදී අප මනස (හදවත) දෙවියන් වහන්සේ වෙත ඔසවනු ලබන ක්‍රියාවන් **දෙකක්** ලියන්න.

(ii) දෙවියන් වහන්සේට ගෞරවයෙන් හා ප්‍රේමයෙන් පොරොන්දු දෙනු ලබන සක්‍රමේන්තු **තුනක්** නම් කරන්න.

(iii) මෑතකදී ඇති වූ ස්වභාවික ව්‍යසනයෙන් පීඩාවට පත් වූ අයගේ ආත්මික සහනය වෙනුවෙන් කළ හැකි ක්‍රියාවන් **පහක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

**4.** (i) අනිවාර්යයෙන් දිව්‍ය පූජාවට සහභාගි විය යුතු දින නම් කරන්න.

(ii) දේව වාක්‍ය පිළිවෙතෙහි අඩංගු කොටස් **තුනක්** ලියා දක්වන්න.

(iii) ඉරු දින දිව්‍ය පූජාවට අර්ථවත්ව සහභාගී වීම සඳහා ඔබ සූදානම් වන ආකාරය කරුණු **පහකින්** පැහැදිලි කරන්න.

**5.** (i) පාළුකරයේදී ජේසුස් වහන්සේ මුහුණ දුන් පළමු හා තුන්වන පරීක්ෂාවලදී උන්වහන්සේ විසින් දුන් පිළිතුරු ලියා දක්වන්න.

(ii) පරීක්ෂා ජයගත් ජේසුස් වහන්සේ තම දූත කාර්යය ආරම්භ කරමින් සිදු කළ ප්‍රාතිහාර්ය **තුනක්** සඳහන් කරන්න.

(iii) කිතුනු සිසුවකු වන ඔබ දුර්පරීක්ෂා හා විවිධ බලවේගවලින් පිරුණු සමාජයක තම කිතුනු කැඳවීම ජීවත් කරවන ආකාරය කරුණු **පහකින්** පැහැදිලි කරන්න.

**6.** (i) 'ස්වාමිවාක් ආරාධනාව' තම සුබාරංචිවල වාර්තා කරන සුවිශේෂකවරු **දෙදෙනා** නම් කරන්න.

(ii) 'ස්වාමිවාක් ආරාධනාවේ' ව්‍යුහයේ අඩංගු කොටස් **තුනක්** ලියන්න.

(iii) අභිවෘද්ධි ආලේපය දානය කරන දිව්‍ය පූජා යාගයේදී යොදාගත හැකි 'විශ්වාසිකයින්ගේ යැදුම්' **පහක්** ලියන්න.

**7.** පහත සඳහන් මාතෘකාවලින් **දෙකක්** තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) ශ්‍රී ලංකාවේ අපෝස්තුළුවරයාණෝ

(ii) දේව ජන වන්දනා වර්ෂය

(iii) ජන නායක මෝසෙස්තුමා

(iv) ආශිර්වාදකාර බන්ධනය හා සිවිල් නීතිය


* * *

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න


# 11 ශ්‍රේණිය කෙටි සටහන් පොත් සංශෝධිත නව විෂය නිර්දේශයේ පාඩමෙන් පාඩමට




Rs : 300





Rs : 300




Rs : 300





Rs : 300





Rs : 300





Rs : 300




Rs : 350





Rs : 300




Rs : 300





Rs : 200





Rs : 200





Rs : 200





Rs : 250





Rs : 250





Rs : 200





Rs : 200





Rs : 200





Rs : 300





Rs : 300




Rs : 200




Rs : 200




Rs : 250





Rs : 650


මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.


LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE


# 11 ශ්‍රේණි ඉංග්‍රීසි මාධ්‍ය කෙටි සටහන් පොත් ENGLISH MEDIAM SHORT NOTE BOOKS Rs 180/-





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180





Rs : 180




Rs : 180




Rs : 180




Rs : 180

මෙම කෙටි සටහන් පොත් සකස් කොට ඇත්තේ ජාතික අධ්‍යාපන ආයතනය මගින් සම්පාදනය කොට ඇති නව විෂය නිර්දේශය අනුව, විෂය ප්‍රවීණත්වයෙන් යුත් සම්පාදක මණ්ඩලයක් විසිනි, එහෙයින් මෙහි අන්තර්ගත සියලු සටහන් එම විෂය නිර්දේශයේ සෑම මාතෘකාවක්ම ආවරණයකොට තිබේ. මෙම ග්‍රන්ථ සම්පාදනය කිරීමේ දී පූර්ණ අවධානය යොමුකොට ඇත්තේ සිසුන්ට මෙන්ම ගුරුවරුන්ට ද අවශ්‍යයෙන්ම මතකයේ තබා ගත යුතු සියලු කරුණු අන්තර්ගත කරමින් වන හෙයින් වෙනත් අතිරේක ග්‍රන්ථ පරිහරණයකින් තොරව වුවද අදාල විෂය නිර්දේශයේ වැදගත් කරුණු සියල්ල ඉතා පහසුවෙන් හැදෑරීමේ මෙන්ම මතකයේ රඳවා ගැනීමේ හැකියාව ද ලැබෙනු ඇත.

LOL.LK
LOL STORE (PVT) LTD
CASH ON DELIVERY
VISA
mastercard
KOKO
037 20 60 110
071 77 74 440
Buy Now
CLICK HERE